රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:(94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்:(94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: R/6/2(II)/OPN/2018

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2020.01.03

**යොමු අංකය** :

**ජා.හැ. අංකය** :

**විභාග අංකය** :

**ලකුණු සංඛ්‍යාව** :

**කුසලතා අංකය** :

................ මහතා/ මහත්මිය/මෙනවිය,

**<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තිය II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018</u>**

**<u>දෙවන වටය</u>**

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018.10.13 දින පවත්වන ලද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල මත පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට ඔබ සුදුසුකම් ලබා ඇති බව සතුටින් දන්වමි.

02. ඒ අනුව, රජයේ ඒකාබද්ධ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තිය II ශ්‍රේණියේ තනතුරක් ලබාදීම සම්බන්ධයෙන් ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය **................** වැනි දින ............ ට කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශයේ දී පවත්වනු ලැබේ.

03. නියමිත දින නියමිත වේලාවට ඒ සඳහා සහභාගී වන ලෙස ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන විට පහත සඳහන් ලියකියවිලි ද රැගෙන ආ යුතුය.

I. ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ වෙනත් වලංගු හැඳුනුම්පතක්.

II. උප්පැන්න සහතිකය.

III. (අ) ඔබගේ අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල මුල් පිටපත සහ විස්තරාත්මක සටහනේ මුල්පිටපත (උපාධි සහතිකය /පශ්චාත් උපාධි සහතිකය /පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය/NVQ 7 සහතිකය)

(ආ) ඔබ ලබා ඇත්තතේ NVQ 7 සහතිකයක් පමණක් නම් ඔබගේ සේවා පළපුරුද්ද සහතික කිරීමේ ලියකියවිලිවල මුල්පිටපත.

IV ඉහත I, II, හා III හි සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත්.

V ඔබ භාවිතා කරන නමේ හා උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතික පත් වල සඳහන් වන නමේ සුලු හෝ වෙනසක් ඇත්නම්, එම වෙනස පැහැදිළි කිරීම සඳහා විධිමත් ආකෘතියකින් යුත් දිවුරුම් ප්‍රකාශයක්. (අදාල සහතික වල නම් වෙන වෙනම සඳහන් කරමින් එම නම් වලින් සඳහන් වන්නේ එකම පුද්ගලයකු බවට ප්‍රකාශ කරමින් රු. 50 /-ක අවලංගු නොකරන ලද මුද්දරයක් මත ඔබගේ අත්සන තබා සාමදාන විනිසුරුවරයකු හෝ දිව්රුම් කොමසාරිස්වරයකු විසින් එය සහතික කළ යුතුය.)

VI විභාග කොමසාරිස් ජනරාල් විසින් ඔබ වෙත පෞද්ගලිකව නිකුත් කළ උක්ත තරග විභාග ප්‍රතිඵල ලේඛනයේ මුල් පිටපත. (මේ වනවිට ලැබී ඇත්නම්)

VII ඔබ පදිංචි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබා ගෙන, ප්‍රාදේශීය ලේකම් වෙතින් අනු අත්සන් කරවා ගත් පදිංචි සහතිකය (ඩී.එස්.4 ආකෘතිය මගින් විය යුතුය).

04. **නියමිත දිනයේ සම්මුඛ පරීක්ෂණයට නොපැමිණීම පත්වීමක් ලබා ගැනීම සඳහා ඔබගේ අපේක්ෂාවක් නොමැති සේ සළකනු ලබන අතර, මේ සම්බන්ධයෙන් පසුව කරනු ලබන කිසිදු විමසීමක් මොනම හේතුවක් මත හෝ සළකා බලනු නොලැබේ.**

05. මේ සඳහා ගමන් වියදම් හෝ කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. පත්වීමක් ලැබීම සඳහා අංක 2071 දරන 2018.05.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද යථෝක්ත විභාග නිවේදනය ප්‍රකාරව, අදාළ තනතුර සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවුවක් වන අතර එය පත්වීමක් ලබා ගැනීමට ඔබට ඇති අයිතියක් නොවන බව ද, මෙම ලිපිය නිකුත් කිරීමෙන් පමණක් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සකු නොවන බව ද කාරුණිකව සලකන්න.

07. රාජ්‍ය සේවයේ තනතුරකට බඳවා ගැනීම සඳහා පවත්වන සම්මුඛ පරීක්ෂණයක් වන බැවින් ඊට සුදුසු ඇඳුමකින් සැරසී සම්මුඛ පරීක්ෂණයට පැමිණීම අගය කරමි.

08. මෙම කැඳවීම අනුව ඔබ නොපැමිණෙන්නේ නම්, ඒ බව ලිඛිතව ඉතා ඉක්මණින් මා වෙත දන්වන්නේ නම් මැනවි.

මෙයට - විශ්වාසී,

අත්.කළේ/ කේ.වී.පී.එම්.ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඒ.එම්. මනෝජ නදීශන අමරසිංහ
ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ